


# බුදුගුණ දැන සිත් සනසමු

අප ජීවත් වන සමාජයේ ඇතැමුන්ට ගරු සැලකිලි ලැබෙනුයේ ඔවුන්ගේ වත් පොහොසත්කම් නිසා ය; ඔවුන් සතු ව බොහෝ ධන ධාන්‍ය ඇති නිසාය. මෙලෙසින් ම සමහරු බලතල නිසා ද තවත් සමහරු නිලතල නිසා ද ගරු බුහුමන් ලබති. මේ හැරුණු විට කුල ගෝත්‍ර නිසා මෙන් ම කාය ශක්තිය නිසා ද, හැඩ රුව නිසා ද මිනිස්සු තවත් මිනිසුන්ගේ ගෞරවයට, සම්භාවනාවට හා ඇගයීමට පාත්‍ර වෙති. එහෙත් බුදු දහම අනුව අප තවත් කෙනෙකුට ගරු කළ යුත්තේ, සැලකිය යුත්තේ, තවත් අයකු අනුගමනය කළ යුත්තේ ධනවත්කම, බලවත්කම, නිලය, කුලය, ශරීරයේ හැඩරුව අනුව නොවේ; ගුණ නුවණ අනුවයි. ලෝකයෙහි ශ්‍රේෂ්ඨතම අග්‍රගණ්‍ය කරුණ වන්නේ ගුණවත්කම හා නැණවත්කම ය. ඉහත කී ධනයෙන්, නිලයෙන්, බලයෙන් හෝ කාය ශක්තියෙන් වුව ද තමාටත් ලෝකයාටත් ඵලදායක යමක් කළ හැක්කේ ගුණ නුවණින් පිරිපුන් මිනිසාට ය.

ලෝකයෙහි එදා මෙදා තුර පහළ වූ ගුණවතුන් හා නැණවතුන් අතර අතිශ්‍රේෂ්ඨ උතුමාණන් වන්නේ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ය. බෞද්ධයන් වන අපි උන් වහන්සේ තරම් ගුණ නුවණින් අගතැන්පත් වෙනත් කිසිවෙකු ගැන නොදනිමු. උන් වහන්සේ අනන්ත ගුණ ඇති සේක; අනන්ත නුවණ ඇති සේක. බුදුරජාණන් වහන්සේ ධරමාන කාලයේ දී පවා උන් වහන්සේගේ ගුණ නුවණ දඹදිව පුරා පැතිරී තිබිණි. රාජ රාජ මහාමාත්‍යයින්ගේ පටන් ඉතා අසරණ අහිංසක මිනිසුන් දක්වා බුදු ගුණයත්, බුදු නුවණත් ඇගයීමට හා සම්භාවනාවට ලක් වූ බව සූත්‍ර දේශනාවලින් පෙනේ. උන් වහන්සේ වෙත පැවති අනන්ත ගුණ නුවණ සැකෙවින් සංග්‍රහ කොට දැක්වෙන අවස්ථා අතර නව අරහාදී බුදුගුණ පාඨය වඩාත් ප්‍රකට ය.

පළමු ව බුද්ධ වන්දනාවේ දී අප ප්‍රකාශ කරනුයේ ඉහත කී නව ලොව්තුරා බුදු ගුණයි. එහෙත් එම බුදු ගුණවල අර්ථය නොදැන සජ්ඣායනා කිරීමෙන් හෝ වන්දනා කිරීමෙන් උසස් ප්‍රතිඵල නොලැබේ. අර්ථ මෙනෙහි කරමින් ඉහත කී පාඨය සජ්ඣායනා කළ යුතු ය. ඒ සමග ම අපට බුද්ධ වන්දනාව ද කළ හැකි වේ. එසේ අවබෝධයෙන් යුතු ව, නිසි ලෙස නව අරහාදී ලොව්තුරා බුදු ගුණ ප්‍රකාශ කරන, මෙනෙහි කරන, වන්දනා කරන තැනැත්තා තුළ සැදැහැවත් බව වැඩි දියුණු වෙයි; බුදුරදුන් පිළිබඳ විශාල ගෞරවයක් ද පැහැදීමක් ද සිත තුළ උපදියි. ඔහුට විසිරුණු සිත එක් තැන් කර ගත හැකි ය. බුද්ධානුස්සති නම් වූ භාවනාවට ඔහු යොමු වෙයි. හෙතෙම ශ්‍රද්ධාව පෙරටු කොට ගත් නිවන් මගට පිවිසෙන්නේ ය. දුක් සහිත සසර නිමා කරලන්නට මෙකී බුද්ධානුස්සතියත්, ශ්‍රද්ධාවත් මග සලසයි. එපමණක් නොව සසර බොහෝ සැප ලබන්නට උපකාරී වන පින් දහම් රැස්කර ගැනීමට ද මෙමගින් පෙළඹීමක් ඇති වෙයි. වැඳුම් පිදුම් කිරීමෙන් මෙන් ම වෙනත් වතාවත් කිරීමෙන් ද බුදු ගුණ දන්නා තැනැත්තා සසර සැප ලබන බොහෝ පින්කම් කරයි. එදිනෙදා ජීවිතයේ දී අප සිත් සතන් තුළ ඇතිවෙන බිය, තැති ගැනීම, ලොමුඩැහැ ගැනීම ආදියෙන් අත් මිදීමට ද නව අරහාදී බුදු ගුණ මෙනෙහි කිරීම නිසැක ව ම උපකාරී වන්නේ ය.

**ඉතිපි සෝ භගවා**
**අරහං**
**සම්මා සම්බුද්ධෝ**
**විජ්ජාචරණ සම්පන්නෝ**
**සුගතෝ**
**ලෝකවිදූ**
**අනුත්තරෝ පුරිසදම්ම සාරථී**
**සත්ථා දේව මනුස්සානං**
**බුද්ධෝ**
**භගවා'ති.**

## 1. අරහං

බුදුරජාණන් වහන්සේ රහසින්වත් පව් නොකළ හෙයින් ද, ලෝභ, ද්වේෂ, මෝහාදී සියලු කෙලෙස් නැසූ හෙයින් ද, සියලු පුද පූජාවන් ලැබීමට

සුදුසු වූ හෙයින් ද අරහං ගුණයෙන් යුක්ත වන සේක. මෙම බුදුගුණය වීදාගම මෛත්‍රේය හිමිපාණන් වහන්සේගේ බුදුගුණාලංකාරය නම් පද්‍ය ග්‍රන්ථයෙහි මෙසේ දක්වෙයි.

රහසත් පව් නො කොට
කෙලෙස'රයනුත් දුරු කොට
නිසි වූයෙන් පුදට
අරහ යැයි නම කියති මුනිඳුට

## 2. සම්මා සම්බුද්ධ

බුදු පියාණන් වහන්සේ ලෝකයෙහි ඇති අතීත, වර්තමාන, අනාගත යන තුන් කාලයට ම අයත් සියලු දේ, අත්ලෙහි වූ නෙල්ලි ගෙඩියක් මෙන් මනා ව දත් හෙයින් 'සම්මා සම්බුද්ධ' ගුණයෙන් යුක්ත වන සේක. බුදුගුණාලංකාරයේ මෙසේ සඳහන් වෙයි.

තුන් කල්හි ම පැවති
පදරුත් සියල් ලොව ඇති
අතැ'ඹුල සෙ දනගති
එයින් සම්මා සම්බුදුන යෙති

## 3. විජ්ජාචරණ සම්පන්න

බුදු පියාණන් වහන්සේ සියලු කෙලෙස් බිඳ දමා උපදවා ගත් විදර්ශනා ඥානය, ඍද්ධි විධ ඥානය ඇතුළු අෂ්ට විද්‍යාවෙන් ද, චරණ ධර්ම නම් වූ ශීලාදි ගුණ පසළොසකින් ද සමන්විත වන බැවින් විජ්ජාචරණ සම්පන්න ගුණයෙන් යුක්ත වන සේක. බුදුගුණාලංකාරයේ එය මෙසේ දක්වා ඇත.

විද්දෑ නැණ අට ද
පසළොස් චරණ ගුණය ද
ඇතියෙන් එමුනි සඳ
පිරුණු විජ්ජාචරණ නම් ලද

## 4. සුගත

භාග්‍යවත් වූ බුදු පියාණන් වහන්සේ, සියලු කෙලෙස් බිඳ දමා නිවනට ගමන් කළ හෙයින්, යහපත් ගමන් ඇති හෙයින් හා සුන්දර වූ වචන ප්‍රකාශ කරන හෙයින් ද සුගත නම් වන සේක. වීදාගම මා හිමියෝ එම බුදු ගුණය මෙසේ කවියට නගති.

යහපත් කොට යෙතැයි
සුන්දර තැනට සැපතැයි
සොඳුරු බස් කියතැයි
කියති ඒ මුනි රජුට සුගතැයි

## 5. ලෝකවිදූ

ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ, සියලු කෙලෙස් නසා තුන් ලොව පිළිබඳ ව මනා කොට දැන, නොදන්නා වූ ලෝක ප්‍රජාවට ඉතා පැහැදිලි ලෙස දේශනා කළ බැවින් 'ලෝකවිදූ' වන සේක. ඒ බව බුදුගුණාලංකාරය මෙසේ දක්වයි.

තුන්ලොව තතු ලෙසට
දැනගෙන නොදත් මෙලොවට
දෙසුයෙන් නියම කොට
ලෝකවිදූ යැයි කියති මුනිඳුට

## 6. අනුත්තරෝ පුරිසදම්ම සාරථී

බුදුරජාණන් වහන්සේ දමනය කළ නොහැකි සියල්ලන් දමනය කිරීමේ හැකියාවෙන් යුක්ත වන බැවින් අනුත්තර පුරිසදම්ම සාරථී නම් වන සේක. බුදුගුණාලංකාරය කතුවරයා මෙම ගුණය කවි දෙකකින් මෙසේ විස්තර කරයි.

හැම ගුණයෙන් නදා
සම වැඩි සතකු හැමදා
දියතෙහි නැති සඳා
අනුත්තර යැයි කියති මුනිඳා

සිත් සතන් පිනවන සියලු ගුණවලින් තමන් වහන්සේට සමාන වූ හෝ වැඩි වූ හෝ සත්ත්වයන් සදාකල්හි ම ලෝකයෙහි නැති හෙයින් බුදුරජාණන් වහන්සේට 'අනුත්තර' යැයි කියති.

බඹ සුර යකුන් තද
දමනය කර තමන් ලද
සෙත් දී මුනිඳු සඳ
පුරිසදම් සාරථී නම් ලද



දැඩි වූ බඹුන්, දෙවියන් හා යකුන් දමනය කර තමන් වහන්සේ අවබෝධ කර ගත් නිවන් සුවය ලබා දුන් නිසා උන් වහන්සේ 'පුරිසදම්ම සාරථී' නම් වන සේක.

## 7. සත්ථා දේවමනුස්සානං

මෙම ගුණයෙන් ප්‍රකාශ වන්නේ බුදුරජාණන් වහන්සේ දෙව් මිනිසුන්ගේ ශාස්තෘවරයා යන්නයි.

"සත්ථා" යනු සාර්ථවාහකයා ය. එනම් වෙළෙඳ කණ්ඩායම් නායකයා ය. අනතුරුවලින් වැළකී, නියමිත ස්ථානයට ළඟාවන වෙළෙඳ නායකයා මෙන් දුකින් පෙළෙන සත්ත්වයන්ට නිවන් මග පෙන්වා දී සසර කතරින් එතෙර ව නිවනට ළඟාවීමට තුන් ලොවට ම මග පෙන්වූ ගුරුවරයා යන අදහසින් උන් වහන්සේ සත්ථා දේවමනුස්සානං නම් වන සේක.

බුදුගුණාලංකාරයේ මෙම ගුණය මෙසේ දක්වා ඇත.

බව කතරින් එතර
ලනුයෙන් සතන් හැම වර
තිලෝගුරු මුනිවර
වී ය සත්තා නමින් පුවතර

## 8. බුද්ධ

බුදුරජාණන් වහන්සේ, ප්‍රතිවේධ ඥානයෙන් යුක්ත වීම, එනම් චතුරාර්ය සත්‍යය තමන් වහන්සේ විසින් අවබෝධ කර ගනු ලැබීම සහ අන්‍යයන්ට කරුණාවෙන් යුතු ව අවබෝධ කරවීම නිසා 'බුද්ධ' නම් වන සේක.

බුදුගුණාලංකාරයේ බුද්ධ ගුණය මෙසේ දක්වා ඇත.

සිව් සස් සිය නැණින්
දන දන් වී ය කුලුණින්
දුරලයි අනුවණින්
එබුදු නම් වී ය ගුණ පමණින්

## 9. භගවා

සම්බුදු පියාණන් වහන්සේ ගෞරවයෙන් හැඳින්වීම සඳහා නවගුණ පාඨයේ මුලින් මෙන් ම, අවසානයේ ද **භගවා** යන්න දක්වා ඇත. සෝ භගවා ඉති'පි ලෙස සෑම පදයක් පාසා ම මෙනෙහි කිරීම සිත පිනවමින් ශ්‍රද්ධාව ඉපදීමට හේතු කාරක වෙයි.

විශුද්ධි මාර්ගය නම් ග්‍රන්ථයෙහි බුදුරජාණන් වහන්සේ 'භගවා' ලෙස හැඳින්වීමට හේතු වූ කරුණු රැසක් දක්වා ඇත. ඉන් කරුණු කිහිපයක් මෙසේ ය;

- ලෞකික, ලෝකෝත්තර සැප ලැබීමට හේතු වන **භාග්‍යය** හෙවත් කුසල් ඇති නිසා.
- භග ධර්ම එනම් ඉසුරුමත් බව, කීර්තිය, රූප සම්පත්තිය ආදියෙන් යුක්ත වීම නිසා.
- රාග, ද්වේශ, මෝහ ආදි කෙලෙස් මුල් සිඳ බිඳ දමා ඇති නිසා.

බුදුගුණාලංකාරය භගවා බුදුගුණය මෙසේ දක්වයි.

බෙදුයෙන් දහම් කඳ
බජනය කෙළෙන් ගුණ කඳ
බග දහමින් සසඳ
බැවින් බගවත් වී ය මුනි සඳ

ධර්මය බෙදා දැක්වූ බැවින් ද, අනූන ගුණයෙන් යුතු බැවින් ද, භාග්‍යවන්ත වූ බැවින් ද මුනීන්ද්‍රයන් වහන්සේ 'භගවා' නම් වූහ.

මේ ආකාරයෙන් අරහාදී බුදුගුණ නවයක් වුව ද, බුදුගුණ අලංකාරයේ වීදාගම මහා මෛත්‍රේය හිමිපාණන් විසින් කවි දහයකින් එය විස්තර කර ඇත.

මෙම උතුම් බුදුගුණ නිතර නිතර මෙනෙහි කරන්නේ නම් අප තුළ ශ්‍රද්ධාව වැඩි දියුණු වේ. සිත දූෂණය කරන කෙලෙස්වලට අප සිත් තුළ සැරිසැරීමට අවස්ථාව නොලැබේ. එම නිසා ලැබෙන සෑම මොහොතක ම බුදුගුණ මෙනෙහි කිරීම ඉතා ප්‍රයෝජනවත් ය. නිරතුරු ව ම බුදුගුණ සිතන, බුදුගුණ වර්ණනා කරන, බුදුගුණ සිහි කර වඳින දරුවන් වන්නට උත්සාහ කරමු. එමගින් අප තුළ ද ගුණ දම් වැඩෙයි.



## සාරාංශය

ඉතිපිසෝ පාඨයෙහි,

- අරහං
- සම්මා සම්බුද්ධ
- විජ්ජාචරණ සම්පන්න
- සුගත
- ලෝකවිදූ
- අනුත්තර පුරිසදම්ම සාරථී
- සත්ථා දේවමනුස්සානං
- බුද්ධ
- භගවා වශයෙන් බුදු ගුණ නවයකි. එක් එක් බුදු ගුණයක් තුළ ගුණ රාශියක් ඒකරාශී වී ඇත. වීදාගම මෛත්‍රේය හිමි විසින් නව අරහාදී බුදුගුණ ඇසුරින් බුදුගුණාලංකාරය රචනා කර ඇත. අපට ජීවමාන ව බුදුරජාණන් වහන්සේ දැකිය නොහැකි වුවත්, උන් වහන්සේ සතු වූ ගුණ දැන, දැක, ශ්‍රද්ධාව උපදවාගෙන තම ජීවිතයට චරිතායනය කර ගත යුතු ය.



## ක්‍රියාකාරකම

1. නව අරහාදී බුදුගුණ නම් කරන්න.

2. එක් බුදුගුණයක් තෝරාගෙන බුද්ධානුස්සති භාවනාව වඩන ආකාරය ලියා දක්වන්න.



## පැවරුම

පංතියේ සියලුදෙනාම එකතු වී ලෝවැඩ සඟරාව, ගුත්තිල කාව්‍යය වැනි ඔබට සොයාගත හැකි සිංහල පද්‍ය ග්‍රන්ථ වල ඇතුළත් ආරම්භක බුද්ධ වන්දනා කවි එකතු කර පොතක් පිළියෙල කරන්න.